**කෝරලෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාව 2021**
**------------------------------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

කෝරලෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෝරලෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**
**----------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**---------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා සභාවේ ස්ථිර සේවකයින් සහ සභිකවරුන්ට සහා අරමුදලින් ගෙවන ලද රු. 3,014,840 ක වැටුප ලැබිය යුතු සේවක වැටුප් ප්‍රතිපූර්ණ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.<br><br>(ආ) සමාලෝචිත වර්ෂ අවසානයට JCB යන්ත්‍ර වෙනුවෙන් ගෙවිය යුතු ණය වාරික සහ පොලී වශයෙන් රු. 5,273,452 ක් මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් වශයෙන් දක්වා නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. | ගිණුම් නිවැරදි යුතුය. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 79,816,655 ක් වටිනා වත්කම් ශේෂ 06කට අදාළ ඉඩම් ඔප්පු,ස්ථාවර වත්කම් ලේඛනය, වත්කම් ලේඛන, අයිතිය සනාථ තිරීමේ ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි. | සභාවේ සියළු වත්කම් තක්සේරු කිරීමට කටයුතු කර ඇත. තක්සේරු කිරීම් නිමවීමෙන් පසු වත්කම්වල විස්තර සටහන් කරනු ලැබේ. | වත්කම් සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,384,985 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 893,325 ක් විය.

**2.2 ආදායම් පරිපාලන**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දක්වා ඇත.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මස්කඩ කුලි රු. 324,024 ක්, මාළු වෙළඳ සැල කුලි රු. 852,204 ක් සහ වාහන බදු කුලි රු. 146,122 ක් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මාළු වෙළඳ සැල් වලින් එක් කඩයක් හැර අනිකුත් කඩවලින් කුලි අයකර ඇත. | හිග ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සීමාසහිත ජාතික කඩදාසි සමාගමෙන් 1996 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයවිය යුතු වරිපනම් රු. 11,937,904 ක් සභාව විසින් අයකර නොතිබුණි. | මෙම ආයතනයට එරෙහිව නීතියානුකූලව කටයුතු කිරීමට නොහැකි බැවින් සුදුසු කටයුතු කිරීමට අමශා උපදෙස් දෙපාර්තමේන්තුවෙන් විමසා ඇත. | හිඟ වරපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අයවිය යුතු උසාවි දඩ වසර 10 ඉක්මවූ රු. 1,553,534 ක හිඟ මුදල පළාත් සභාවෙන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සහ ආදායම් අංශයේ තොරතුරු පරික්ෂා කළ නමුත් අදාල ලේඛන සොයා ගැනීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණයක් සිදු කිරීමට තීරණය කර ඇත. | දීර්ඝ කාලීනව හිඟව පැවති උසාවි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ණය සංවර්ධන අරමුදල (LLDF) වෙතින් ලබා ගත් ණය මුදල වසර පහක් ඇතුලත ගෙවා නිමකල යුතුවුවද, සභාව විසින් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 5,273,452 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහන මිලදී ගැනීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන බැවින් සහ සභාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් ණය වාරික ගෙවීමට අපහසුවී ඇත. | ණය ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය. |

3.2 **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ පැවති තනතුරු 07 කට අදාල පුරප්පාඩු 06 ක් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු දැනුවත් කළද සාධනීය පිළිතුර ලැබී නොතිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 134 හි විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි. | සේවක පුරප්පාඩු හේතුවෙන් මෙය සිදුව ඇති අතර ඉදිරියේදි මේ නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | අභ්‍යන්තර විගණන කටයුතු සිදුකළ යුතුය. |

### 4.2 තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධන පනත අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකළ යුතු සංවර්ධන න්‍යායපත්‍රය අනුව එය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන ක්‍රියාකිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | පිළිගනිමි.<br>ඉදිරි මුදල් වර්ෂයේ ක්‍රියාත්මක කරමි. | තිරසාර සංවර්ධන දර්ශක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |